**2022 ජනවාරි මස 18 වන දින පැවති**

**හතළිස් පස්වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2022.01.18**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

**01.** ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**02.** ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**03.** ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**04.** ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**05.** ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**06.** ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**07.** ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**08.** ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**09.** ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**10.** ගරු මන්ත්‍රී එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**11.** ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)
**12.** ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ( ශ්‍රී.ල නි.ප)
**13.** ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය ( එ.ජා.ප)
**14.** ගරු මන්ත්‍රී ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැතිනිය ( එ.ජා.ප)
**15.** ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය (එ.ජා.ප)
**16.** ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා ( ශ්‍රී.ල නි.ප)
**17.** ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා ( ජ.වි.පෙ)
**18.** ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා ( ජ.වි.පෙ)
**19.** ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා (ස්වාධීන කණ්ඩායම)

**දන්වා සහභාගී නොවූ:-**

**20.** ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ( එ.ජා.ප)
**21.** ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා ( එ.ජා.ප)

**නිළධාරීන්:-**

**01.** ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා
**02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.නයෝමි වීරකෝන් මිය

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලද අතර කොවිඩ් වසංගත තත්වය හමුවේ ලෝකයම ආර්ථික, සමාජීය වශයෙන් හා සෞඛ්‍ය වශයෙන් අසරණ බවට පත් කල පසුගිය වසර 02 ක ඇතුළු සිව් වසරක කාලය තුලදී අපහසුතාවයන්ට මුහුණු දෙමින් අප ගෙන ගිය කාර්යයන් වලදී විවිධ ගැටළු මතු වුවත්, ප්‍රාදේශීය සභාවේ පරිපාලන කටයුතු හා මූල්‍ය කටයුතු නිසි ලෙස කළමණාකරණය කර ගනිමින් ඉදිරියට ගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාවක් වශයෙන් උපකාර කල ගෞරවණීය උප සභාපතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ගරු මන්ත්‍රීතුමන්ලාට/ගරු මන්ත්‍රීතුමියන්ලාට ගෞරවණීය ස්තූතිය පුද කරමින් ලැබුවා වූ නව වසර ශ්‍රී ලාංකික ජනතාවටත්, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ

ආදරණීය ජනතාවටත් ලෝකවාසී ජනතාවටත්, නිරෝගීමත් වාසනාවන්ත හා සෞභාග්‍යමත් නව වසරක් වේවායි එක සිතින් ප්‍රාර්ථනය කරන බව සඳහන් කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**<u>202.12.21 මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.12.21 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.12.21 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> 2021.12.21 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලද අතර තමන් විසින් අලි වැට සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයන් හී කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත විය යුතු බවට විස්තරාත්මකව පැහැදිලි කරමින් සඳහන් කලත් එය අවස්ථා දෙකකදී සිදු කරනු ලැබූ ප්‍රකාශයක් ලෙස සටහන් කිරීම සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

ඒ අනුව 2021.12.21 වන දින මහ සභා රුැස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය.**

**01. ප්‍රසස්ථ රාජ්‍ය අංශ ගිණුම් හා කාර්යසාධන තරඟාවලියේ සහතික පත්‍රය පිරිනැමීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් පවත්වන ලද 2019 ප්‍රසස්ථ රාජ්‍ය අංශ ගිණුම් හා කාර්ය සාධන තරඟවලියේදී හොඳම ගිණුම්කරණය ඇඟයීම වෙනුවෙන් පිරිනමන ලද සහතික පත්‍රයක් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව වන අප වෙත 2021 දෙසැම්බර් මස 29 වන දින පිරිනැමූ බව ඉතා සතුටින් මහ සභාවට නිවේදනය කරන ලදී.

**02. නාමල් ශ්‍රී සකී කලායතනය විසින් ස්තුතිය පිරිනැමීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> සාහිත්‍ය කලා උලෙල වෙනුවෙන් අභ්‍යාස පුහුණුවීම් කරවීමට ශාලා පහසුකම් සපයා සභාව ලබා දුන් සහයෝගයට සමස්ථ කලා කරුවන් වෙනුවෙන් හිස නමා ආචාර කරන බවට සඳහන් ස්තුති ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

**03. පළාත් පාලන ආයතන වල සැළසුම් කමිටු සඳහා නිළධාරීන් පත් කිරීම**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 ජනවාරි මස 18 වන දින සිට 2022. ජුනි 30 දක්වා මෙම ප්‍රාදේශිය සභාව මගින් පවත්වනු ලබන සැළසුම් කමිටු සඳහා සහභාගී වන නව නියෝජිතයින් වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ බලාත්මක සැළසුම් නිළධාරී -ආර්.ඒ ධනපාල මහත්මිය සහ නගර නිර්මාණ ශිල්පී - ජේ.ඒ.එස් මධුරංග මහතා පත් කර ඇති බව දන්වන ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

**04.** **ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා සුපිරිසිදු පරිසරයක් නිරෝගිමත් හෙටක් යන තේමා පාඨය යටතේ දිප ව්‍යාප්ත ඩෙංගු වැඩසටහන් මෙම මස 21 හා 22 යන දිනවල පවත්වන ලෙස පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා ඇති බැවින් මේ මස 21 වන දින නෙළුබැව නගරයේත්, 22 වන දින විජයපුර ප්‍රදේශයේත් ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීමට සැළසුම් කර ඇත. ඒ සඳහා බල ප්‍රදේශයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ලබා දෙන ලෙසට  නිවේදනය කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2022  පෙබරවාරි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 පෙබරවාරි මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**2022 පෙබරවාරි**

| | | පැය ගණන |
|---|---|---|
| 01. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 60 |
| 03. එම්.එස්.එම් ගුණවර්ධන මිය | (කළ: සේවා නිළධාරී) | 60 |
| 04. කේ.ජී.ඒ සම්මානි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 05. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 60 |
| 06. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 07. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහායක) | 40 |
| 08. මානෙල් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහායක) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මා.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 40 |
| 11. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 12. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 13. සුභාෂ් ගයාෂාන්    මයා | (අනියම් රියදුරු) | 40 |
| 14. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |
| 15. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර මයා | (විදුලි කාර්මික) | 40 |
| 16. ඩබ් තිලකරත්න මයා | (කා.කා.සහයක) | 40 |

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා 2022 පෙබරවාරි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 පෙබරවාරි මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා පෙ.ව 10.15 පමණ මහ සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

**02.** **ටෙන්ඩර් මගින් ඉල්ලීම් නොකල බදු ආයතන සඳහා ඉදිරි පියවර ගැනීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂය වෙනුවෙන් සභාව සතු බදු ස්ථාන බදු දීමට අදාලව දෙවරක්ම ටෙන්ඩර් කැඳවූවත්, ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවූ පහතින් සඳහන් කරන බදු ස්ථාන ඉදිරියේදී යම් ඉල්ලුම්කරුවෙකු ඉල්ලූ විටකදී අවම තක්සේරු වටිනාකමට අනුව ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | ස්ථානය හා අයිතමය | වාර්ෂික අවම ලංසුව |
|---|---|---|
| 01 | විජයපුර මංසන්දියේ වැව් මාළු ලැල්ල | 50,000.00 |
| 02 | නෙළුම්කුලම මංසන්දියේ පොඩි ඇල අසල වැව් මාළු ලැල්ල | 20,000.00 |
| 03 | ආලංකුගම වැව ඉදිරිපිට වැව් මාළු ලැල්ල | 19,728.00 |
| 04 | කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ මාළු ලැල්ල | 18,075.00 |
| 05 | මොරගොඩ මංසන්දිය අසල වැව් මාළු ලැල්ල | 18,050.00 |
| 06 | ජයබිම නිවාඩු නිකේතනය | 475,750.00 |
| 07 | කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ එළවළු වෙළඳසැළ | 120,000.00 |

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා විජයපුර මංසන්ධියේ පවත්වාගෙන යන මාළු ලැල්ල සම්බන්ධයෙන් වර්ථමානය වන විට ගැටළුවක් පවතින් බැවින් මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන අදාල ස්ථානය නිරවුල් කිරීමට කටයුතු කල යුතු සේම මේ වර්ෂය තුල ටෙන්ඩර් කල නමුත් කිසිදු ලංසුකරුවකු ඉදිරිපත් නොවීම තුල එයද සංචාරක බංගලාවක් ලෙස සභාව මගින් පාලනය කිරීමට කටයුතු කල යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරමින් වර්ථමානය වන විට මාළු ලැලි පවත්වාගෙන යන පුද්ගලයින් ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට පරිභාහිරව පෞද්ගලික වතු තුල මාළු ලැලි පවත්වාගෙන යාමට කටයුතු කරන බවත්, විජයපුර මංසන්ධියේද මෙම තත්වය පවතින අතර මේ තත්වය තුල ඉදිරියේදී අනිවාර්යෙන්ම ගැටළුවක් මතු වන බව සඳහනක් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පසුගිය වසරේ බදු රැගෙන මුදල් නොගෙවූ හෝ ටෙන්ඩර් හිමි නොවූ බදු කරුවන් වෙත අදාල බදු ස්ථානයෙන් ඉවත් වීමට මේ වන විට උපදෙස් ලබා දී ඇති බවත්, එසේ නොකරන පුද්ගලයින්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට සූදානම් වන සේම පෞද්ගලික ඉඩම් තුල පවත්වාගෙන යන

මාළු ලැලි සඳහා වාර්ෂිකව වෙළඳ බලපත්‍රය ලබා නොදීමට කටයුතු කරන බවත්, සඳහන් කරන ලද අතර, මීටර් 200 ක් තුල අදාල මාළු ලැලි ස්ථාපනය කර ගැනීමේ හැකියාව පවතින බව ද සඳහන් කරන ලදී.

තවද ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ටෙන්ඩර් මගින් ලබා නොගත් මාළු ලැලි හා අනෙකුත් බදු ස්ථාන සුදුසු ඉල්ලුම්කරුවෙකු වෙත අවම ලංසුව යටතේ ලබා දීමේ යෝජනාව පැමිණ සිටි ගරු සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

## 03. මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ගරු සභාපති එස්.බී. කුමාරදාස මැතිතුමා 2022.01.07 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

### I. ප්‍රාදේශීය සභාවට අයත් පොලව තලනය කුලී පදනමින් ලබා දීම.

ප්‍රාදේශීය සභාවට අයත් පොලව තලනය කුලී පදනමින් ලබා දීම සඳහා 2022 වර්ෂයට අදාලව ගැසට් කර නොමැති බැවින් 2022 වර්ෂය තුල එම පොළව තලනය දිනකට රු 5,000.00 කට ඉන්ධන රහිතව හා සේවකයෙකු රහිතව ලබා දීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර  මැතිතුමා 2022.01.07 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා  කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 ජනවාරි මස 07 වන දින පැවති මුදල් කමිටුවේ නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

## 04. අපාධිතයින් සඳහා වැසිකිළි ආධාර ලබා දීම.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා කොමඩ් වර්ගයේ සනීපාරක්ෂක උපකරණ ලබා දෙන ලෙස ඉල්ලීම් කරමින් කලත්තෑව බංඩියාලංකුලම 5 කණුව පදිංචි බී.පියදාස මහතා, තම්මැන්නාපුර ධර්මාලංකාර මාවත, අංක 85/1 ලිපිනයේ පදිංචි බී.ඊ.ටී සඳමාලි මිය, කුරුන්දන්කුලම අනුරාධපුර ලිපිනයේ පදිංචි වයි බණ්ඩිරාල මහතා යන අයවළුන් විසින් මා වෙත කරන ලද ඉල්ලීම ගරු සභාවට ඉදිරිපත් කල අතර ඒ සඳහා සභා අනුමැතිය හිමි විය. ඒ අනුව එම සභා තීරණ පළාත් පාලන කොමසාරිස්තුමා මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කල අතර පළාත් පාලන කොමසාරිස්තුමන් විසින් එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (උ) වගන්තිය යටතේ නෛතික ප්‍රතිපාදන මත ගෙවීම් සිදු කල නොහැකි වුවත්, ප්‍රාදේශීය සභා පනතේ 19 (xxii) වගන්තිය යටතේ පැවරී ඇති බලතල මත 2022 වර්ෂයේ මෙම ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ගෙන එම ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගන්නා ලෙස දන්වා ඇති බැවින් ඉහතින් සඳහන් කල පුද්ගලයින් වෙනුයෙවන් අවශ්‍ය සනීපාරක්ෂක උපකරණ ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් බල ප්‍රදේශය තුල කොමඩ් වර්ගයේ සනීපාරක්ෂක උපකරණ ලබා දෙන ලෙස ඉල්ලීම් කළ කලත්තෑව බංඩියාලංකුලම 5 කණුව පදිංචි බී.පියදාස මහතා, තම්මැන්නාපුර ධර්මාලංකාර මාවත, අංක 85/1 ලිපිනයේ පදිංචි බී.ඊ.ටී සඳමාලි මිය, කුරුන්දන්කුලම අනුරාධපුර ලිපිනයේ පදිංචි වයි බණ්ඩිරාල මහතා වෙත එම උපකරණ ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2022 ජනවාරි මස 07 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 දෙසැම්බර් මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා හා එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිණිය අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය 2022 වර්ෂයේ පළමු සභා වාරය ආරම්භ වන අද දින ලැබුවා වූ නව වසර සියළු දෙනාටම සාමය සතුට පිරි සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනය කරන ලද අතර බල ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේදී මාර්ග සලකුණු කර නොතිබීම ගැටළුවක් වන බැවින් මාර්ග ලකුණු කිරීම ප්‍රායෝගිකව ඉතා වැදගත් වන අතරම මාර්ග වල ගමන් ගන්නා වාහන වලට අදාල බර ප්‍රමාණය පිළිබඳවද අවධානය යොමු කල යුතු බවත්, ඒ සඳහා මාර්ගයට ඇතුළු විය හැකි වාහන වල බර ප්‍රමාණය සඳහන් වන පුවරුවක් මාර්ගය ආරම්භ වන ස්ථානයෙන් ප්‍රදර්ශණය කිරීම සුදුසු බවත්, එසේ නොකිරීම තුල මේ වන විටත් අළුත්වැඩියා කරන මාර්ග වල කල් පැවැත්ම සම්බන්ධයෙන් අවධානම් තත්වයක් පැන නගින බවත්, උදාහරණද සඳහන් කරමින් පැහැදිළි කරන ලදී.

තවද යෝධ ඇල බන්ට් එක මාර්ගයේ පස් රැගෙන යන බර වාහන විශාල සංඛාවක් ගමන් කලද මාර්ගයේ පවතින විශාල වලවල් එකක් සඳහාවත් පස් ස්වල්පයක් නොදැමීම ඉතා කණගාටුදායක තත්වයක් බවත්, මෙම ගැටළුවටද විසඳුමක් ලෙස ගමන් කල හැකි වාහන වල බර ප්‍රමාණය පුවරුවකින් සඳහන් කිරීම අත්‍යාවශ්‍ය බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා නව වසරට සුභ පතමින් දීර්ඝ කරන ලද සභා ධූර කාලය හමුවේ අපට මහ ඇරුණු වැඩ ප්‍රමාණය අවසන් කිරීමට අවස්ථාව හිමි වූවත්, මේ වන විට කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් පවතින ගැටළුව සඳහා සමාජය තුල මහත් කතිකාවතක් පවතින අවස්ථාවක සභාවක් ලෙස ආහාර සුරක්ෂිතභාවය වෙනුවෙන් අවධානය යොමු කල යුතු බවත්, ගරු සභාපතිතුමා සඳහන් කල පරිදී බල ප්‍රදේශයේ විවිධ තුලාන වල කෙසෙල් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා සේම නියමු ව්‍යාපෘතියක් ලෙස වගා

කල හැකි ප්‍රදේශ වල තෝරා ගත් පුද්ගලයින් සඳහා තෝරා ගත් වගා හැකි බෝග ලබා දී වගා කරවීමේ හැකියාව පවතින්නේ නම් සුදුසු බවත් මෙය ඉදිරියේ එන ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධ ගැටළුවට විසඳුම් ආදර්ශයක් සැපයිය හැකි බවත් සඳහන් කරන ලදී.

තවද වන අලි තර්ජනය වෙනුවෙන් බල ප්‍රදේශයේ සිදු කරනු ලබන අඟල් කැපීම, කිසිසේත්ම අනුමත කල නොහැකි සේම මේ වන විට එම අඟල කැපීම තුල අලි නොසිටි ප්‍රදේශ වලට අලීන් පැමිණීමේ අවධානමකට පත් වී ඇති බවත්, මේ වන විට කපා ගෙන යන අඟල තුල කළු ගල් හමුවීම මත එම භූමියේ අඟල කැපීම මේ වන විට නතර කර තිබෙන බවත්, මෙලෙස විද්‍යාත්මක නොවන ක්‍රමවේදයන් එක් පුද්ගලයෙකුගේ හෝ කිහිප දෙනෙකුගේ බලය පාවිච්චි කරමින් කරනු ලබන වැඩ පිළිවෙල තුල සභාවත් ලෙසට අවසානයේ අපට වගකිව යුතු වන බැවින් සභාව සතු බලය පාවිච්චි කර මීට අදාල මැදිහත්වීම සිදු කල යුතු බවත්, සඳහන් කරන ලදී.

තවද 260,261,262 ග්‍රාම නිළධාරී තුලාන වල සංවර්ධනය කරන ලද මාර්ග මේ වන විට දෙපසින්ම බැස ඇති බවත්, ඇතැම් ස්ථාන අඩියක ප්‍රමාණයකින් පමණ එය සිදු වී ඇති බවට දක්නට ලැබෙන නමුත් මීට පෙර සභාව විසින් සංවර්ධනය කල එකදු මාර්ගයක්වත් එලෙස දක්නට නොලැබුණු අතරම පස්, වැලි, බොරළු, පටවා ගත් වාහන ගමන් කිරීම මේ සඳහා බලපා ඇති බවත්, සඳහන් කරමින් අවම වශයෙන් මෙම මාර්ග වල ගමන් ගන්නා බර වාහන සඳහා යම් බොරළු ප්‍රමාණයක් මාර්ගයේ වලවල් වලට යොදන ලෙස උපදෙස් ලබා දිය යුතු බවත්, බල ප්‍රදේශයේ ඉඩම් ගොඩ කිරීමේදී වැසි ජලය ගලා යන මාර්ග අවහිර වන අවස්ථා පවතින්නේ ද යන්න අප මැදිහත් වී විසඳා ගත යුතු බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද කොවිඩ් වසංගත තත්වය හමුවේ අධ්‍යාපනය සම්බන්ධයෙන්ද අවධානය යොමු කල යුතු අවස්ථාවක බල ප්‍රදේශයේ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන කෙරේ අප අවධානය යොමු කල යුතු බවත්, මේ සඳහා ළමා රක්ෂක අධිකාරිය සමඟ එක් වී එම ගැටළු විසඳීමට පියවර ගත යුතු බවත් සඳහන් කරමින් බල ප්‍රදේශය තුල සිදු කරන සංවර්ධන ක්‍රියාදාමයට අප මීට වඩා ගැඹුරින් අවධානය යොමු කල යුතු බවත්, නෙළුබැව මංසන්ධියේ ඉදි කරනු ලබන කඩ කාමර සම්බන්ධයෙන්ද ගැටළු ගණනාවක් පවතින බවත්, එහිදී සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම හා ඉහල මහල වෙනුවෙන් එක් එක් කඩ කාමරය තුලින් තරප්පුව ඉදි කිරීම හේතුවෙන් අදාල භූමියේ විශාල ඉඩ කඩ ප්‍රමාණයක් ඇහිරී යන අතරම කඩ කාමරය පිටුපස කොටස ද ගබඩා කාමරයක් හෝ වාහන රථගාලක් ලෙස සකස් කිරීමේ හැකියාව තිබියදී එය අපතේ හැරීම ද අපරාධයක් වන අතර අනුමත කර ඇති සැළසුමේ විශාල ගැටළු ගණනාවක් පවතින බවත්, මෙතනින් එහාට එවැනි පොදු ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී මීට වඩා සැළකිලිමත් වෙමුයි යන්න දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා</u> ලැබුවා වූ නව වසරට සුභ පතමින් ගෙවී ගිය වසර 03,04 ක කාලය තුල කොවිඩ් වසංගත තත්වය හමුවේ වුවත්, සිදු කල යුතු සංවර්ධනයන් ඉක්මනින් ගෙනවිත් සුදුසු ආකාරයෙන් ඉටු කර ගැනීමට රජය විසින් ගෙන ගිය සාර්ථක වැඩපිළිවෙල අගය කල යුතු අතර ඒ තුල නිවාස ඉදි කිරීම්, මං මාවත්, සංවර්ධනය, ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවශ්‍යතා හඳුනා ගනිමින් තිරසර ඉලක්ක කරා ගමන් ගත් බව සතුටින් ප්‍රකාශ කරන බවත්, මේ වන විට ඇතැමුන් විසින් කෘෂිකර්මාන්තය පසු බෑමකට ලක් වී ඇති බවට ප්‍රකාශ කලත්, තමන් 100% පිළි නොගන්නා අතර, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල වී වගාව ඇතුළු අනෙකුත් බෝග වගාවන් තුලින් ලාභ ලැබූ ගොවීන් සිටී අතරම කාබණික ගොවිතැන වෙනුවෙන් උත්සහ කල ගොවීන් යහපත් ඉලක්ක කරා ලගා වූ අවස්ථා බොහොමයක් පවතින නමුත් ඇතැම් පක්ෂ කරනු ලබන විවිධ ප්‍රකාශ කිසි සේත්ම නිවැරදි බවට සඳහන් කල නොහැකි බවත්, තමන් තම කොට්ඨාශය තුල සිදු කරනු ලබන සෑම ගොවි තැනක්ම නිරීක්ෂණය කරන බවත්, ගොවීන් සඳහා ලබා දුන් කාබණික පොහොර වල සාර්ථක ප්‍රතිපල තිබුනා වුවත්, ඒ සඳහා වැරදි නිර්වචන ඉදිරිපත් කරමින් සම්පූර්ණයෙන්ම හෙලා දකින ඇතැමුන් එහි යහපත් ඉසව්ව නොදැකීම දැඩි ලෙස හෙලා දකින අතර, ඒවා 100% අසාර්ථක වැඩ පිළිවෙලක් නොවන නමුත්, අප විසින් ජාතික වැඩ පිළිවෙලක් ලෙස අනිවාර්යෙන්ම රජයට සහයෝගය ලබා දිය යුතු බවත්, පසුගිය වසරක කාලය තුල අප ජනතාව වෙනුවෙන් ගෙවතු වගා

ස්ථාපිත කිරීම වෙනුවෙන් අවශය බීජ ලබා දී සාර්ථක වැඩපිළිවෙලක් දියත් කල පරිදී ඉදිරියේදීද එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරමුයි යන්නත් සඳහන් කරන ලදී.

තවද ගරු සභාපතිතුමා විසින් මීට පෙර සඳහන් කල ගිණුම් කටයුතු වෙනුවෙන් හිමි වූ සහතික පත්‍රය දැඩි අපහසුතාවයන් මැද ලගා කර ගත් ජයග්‍රහණයක් බවට කිසිදු සැකයක් නොමැති අතර, ඒ වෙනුවෙන් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ස්තූතිය පිරිනමන අතර ඉදිරි කාලය තුල දැඩි කඩිසරකමකින් යුතුව අපට අවශා ඉලක්කු කරා ගමන් කරමුයි යන්නත්, සඳහන් කරන ලදී.

තවදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ඉදිරි වර්ෂයක කාලය තුල අප නිවාස මට්ටමින් ජනතාවගේ අවශ්‍යතා මොනවාද යන්න සමීක්ෂණයක් සිදු කරමුයි යන්නත්, තම කොට්ඨාශය මේ වන විට නිෂ්පාදිත ගම්මානයක් බවට පත් කරමින් කිරි එළදෙනුන් ලබා දීමේ වැඩපිළිවෙලක් ආරම්භ කර ඇති සේම සිය කොට්ඨාශය තුල කිසිදු පැල්පත් නිවසක් නොමැති බවත්. ඒ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාට ස්තූතිවන්ත වන බවත්, සඳහන් කරන ලදී.

තවද ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සඳහන් කළ පරිදී අධ්‍යාපනය තරමක් දුරට බිඳ වැටී ඇති බවට සඳහන් කිරීම නිවැරදි බවත්, පසුගිය කාලය තුල ගුරුවරුන් විසින් කරන ලද ඉල්ලීම් ඉටු කරමින් මේ වන විට දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ආරම්භ කරගෙන පවත්වාගෙන යන නමුත් ඔවුන් කල කාර්යය නිවැරදි බවට සඳහන් කල නොහැකි බවත්, මේ අවස්ථාවේදී ඇතැම් පක්ෂද බොරදියේ මාළු බෑම සිදු කල බවත්, සඳහන් කරන ලදී.

අනතුරුව අවසන් වශයෙන් අපගේ ඉදිරි කාලය තුල රටේ සිදු වන වේගවත් සංවර්ධනය සහයෝගය ලබා දෙමින් කැපවීමෙන් කටයුතු කරමුයි යන්නත්, ආදායම් උත්පාදන ක්‍රමවේදය කෙරේ අවධානය යොමු කරමුයි යන්නත්, සඳහන් කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> මේ වන විට 2022 වර්ෂය වෙනුවෙන් ටෙන්ඩර් කලත් ලංසු කරුවන් ඉදිරිපත් නොවූ ජයබිම උත්සව ශාලාව ප්‍රාදේශීය සභාව මගින් පවත්වා ගෙන යාමට අදහස් කර ගෙන සිටීම තුල සිදු කල යුතුව පවතින්නේ සංචාරක බංගලාවක් පවත්වා ගෙන යන අයුරින් පැය 24 ම රැඳී සිටිමින් සේවය සැපයිය හැකි පුද්ගලයෙකු යෙදවීම බවත්, ඒ සඳහා ප්‍රාදේශිය සභා පනතේ 19 (13) වගන්තිය ප්‍රකාරව පැය 24 ක සේවා කාලයේ සිට උද්‍යාන කටයුතු , සනීපාරක්ෂ කටයුතු ආදී සියළු කාර්යයන් සිදු කල හැකි වන පරිදී එකඟතාවය ලබා ගනිමින් සේවයේ යෙදවිය යුතු බව සඳහන් කරන ලදී.

තවද බල ප්‍රදේශයේ මාර්ග වල ප්‍රවාහනය කල හැකි බර ප්‍රමාණය සඳහන් පුවරු පටු මංමාවතක ප්‍රදර්ශණය කලත් ග්‍රාමීය මාර්ග වල එලෙස බර ප්‍රමාණය දැක්වීම වෙනුවෙන් සභාව විසින් මාර්ග ගැසට් කල යුතුව පවතින බව ද සඳහන් කරන ලදී.

තවද නෙළුබැව නගරයේ ඉදි වන කඩ කාමර සම්බන්ධයෙන් ඉරිදා ලංකාදීප පුවත්පතේ රජරට අතිරේකයේ පල කල ලිපිය තුල ගරු සභාපතිතුමා විසින් කරන ලද ප්‍රකාශයේ හෝ ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා කරනු ලැබූ ප්‍රකාශය තුල ප්‍රාදේශීය සභාවට කිසිදු අහිතියක් සිදු නොවූවද එම ලිපියේ ශීර්ෂය යටතේ සඳහන් කල කරුණ දුටු විට ප්‍රාදේශිය සභාව විසින් විශාල වරදක් සිදු කරන බවට ප්‍රකාශ කෙරෙන බවත්, ප්‍රාදේශීය සභාවට හිමි වී ඇති බලතල ප්‍රකාරව යම් අනවසර ඉදි කිරීමක් පවතින්නේ නම් එය නතර කිරීමේ හැකියාව පවතින නමුත් , ඔවුන්ට එලෙස ඉදි නොකරන ලෙසට දැනුම් දී හෝ භූමිය අත්පත් කර නොමැතිනම් හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානය වෙනුවෙන් කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් කර නොතිබියදී මෙලෙස සභාවට විරුද්ධව ප්‍රකාශයන් හෝ නීතිමය පියවරකට යනවා නම් එය සුදුසු නොවන ක්‍රියාවක් බවත්, මීට ඉහතදී 1983 දී බලයට පත් වී සිටී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් නෙළුබැව නගරය අඩි 07 ක පස් ඉවත් කරන අවස්ථාවේදී කිසිවෙකු එයට විරුද්ධව ප්‍රකාශයන් හෝ ඉඩම් වල අයිතිය ඉල්ලා නොසිටි බවත්, ආසන්නයේ

ඉදි කර ඇති පශු වෛද්‍ය ගොඩනැගිල්ල ඉදි කිරීමේදී ප්‍රාදේශිය සභාවෙන් ඊට අදාල සැළසුම අනුමත කර ගත් බවත්, එම ගොඩනැගිළිද මෙම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයද නිසි සැළසුමකට අනුව ඉදි කර නොමැති බවත්, නෙළුබැව නගරයේ පාසල ඉදිරිපිට භූමි සියල්ල අධ්‍යාපන කටයුතු වෙනුවෙන් වෙන් කර තිබෙනවා සේම තවත් වටිනාකමින් යුතු ඉඩම් පැවතියද ඒ කිසිවක් වෙනුවෙන් කිසිදු රාජ්‍ය ආයතනයක් ඉදිරිපත් නොවුනා සේම මේ වන විට එම ඉඩම් වල පදිංචි පුද්ගලයින් ඔප්පු පවා සකස් කරගෙන අවසන් බවත්, මෙලෙස සැළකිය යුතු තැන් පවතිද්දී මෙලෙස අනවශ්‍ය ගැටළුවක් ඇති කර ගන්නවාට වඩා ඉතාම සුහද ශීලීව විසඳා ගැනීමට කටයුතු කල යුතු බව සඳහන් කරන ලදී.

තවද වන අලින් සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණ එම අවස්ථාවේදීම ක්‍රියාත්මක කලා නම් ඒ සම්බන්ධයෙන් අප මෙන්ම අනෙකුත් පාර්ශව ගැටළුවලට මුහුණ නොදෙන බවත්, මීට පෙර මහ සභාවේ දී අඟල් කපන භූමියේ කළු ගලක් මතු වුවහොත් එය ඉවත් කරන බවට කොන්ත්‍රාත් කරු සමඟ එකඟවිය යුතු බවට සඳහන් කල නමුත් එසේ නොකිරීම තුල මේ වන විට තමන් ප්‍රකාශ කල ගැටළුව මතු වී ඇති බවත්, මේ පිළිබඳ අදාල රාජ්‍ය ආයතන දැනුවත් කිරීමේ හැකියාව ප්‍රාදේශිය සභාව සතුව තිබුණා නම් ඉතාමත් වටිනා බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද කෘෂිකර්මාන්තය තුල පවතින කාබණික පොහොර සම්බන්ධ ගැටළුවේ පවතින්නේ ක්‍රමවේදය සම්බන්ධ පවතින ගැටළුවක් වන  බවත්, මෙය සැම දෙනාම දන්නා අතර, නාච්චාදූව ව්‍යාපාරය තුල පවතින වී ගොවතැන සශ්‍රීක නම් , ඒ කොට්ඨාශයේ මන්ත්‍රීතුමා සතුටු වන්නේ නම් මුළු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ජනතාවට සතුටු විය හැකි බවට පත් කල යුතු බවත්, ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා විසින් පසුගිය මහ සභාවේදී ගෙන ආ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් වන යෝජනාව තුල අපට කල හැකි කාර්යයන් තවමත් ඉටු නොවීම තුල අපට අනාගතය සම්බන්ධයෙන් බියක් ඇති වන සේම අද ලෝකයේ රටවල් සිල්ල තම රටේ අවශ්‍යතාවය සපුරා ගැනීමෙන් අනතුරුව ඉතිරි ප්‍රමාණය අපනයනය කලද අප රට නිෂ්පාදන ඇතත්, නැතත් අපනයනය කිරීම සඳහා සූදානමින් සිටින බවත්, ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ගෙන ආ යෝජනාව තුල මුළු රටටම ආදර්ශයක් සපයන නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරමුයි යන්න අදහස් කර ගත්තත්, එසේ ක්‍රියාත්මක නොකිරීම අපරාධයක් බවත්, සඳහන් කරන ලදී.

තවද රට තුල පවතින ගැටළු වලදී එක් එක් පක්ෂය වෙනුවෙන් ඇඹිල්ල දිගු නොකර සිය පක්ෂයේ පිරිසිදු ප්‍රතිපත්තියේ සිට ප්‍රාදේශිය සභාව ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන මහජන නියෝජිතයින් ලෙස කටයුතු කරනවා හැර සුරංගනා ලෝක මවා රටවැසියන් සතුටින් සිටිනවා යන අසත්‍ය ප්‍රකාශ සිදු කරනවාට වඩා පවතින යතාර්ථය තුල සිට කටයුතු කල යුතු අතර, පොහොර ගැටළුව සඳහා අනිවාර්යෙන්ම ජාත්‍යන්තර කුමන්ත්‍රණයන්ගේ බලපෑමට හසු වූ බව අප සියළු  දෙනා දන්නා බැවින් අනවශ්‍ය සුදු හුණු ගෑමක් සිදු නොකර මුළු රටටම ආදර්ශයක් සැපයිය හැකි නියමු ව්‍යාපෘතිය ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමාගේ සහයෝගයද සහිතව බල ප්‍රදේශයේ තෝරා  ගත් ගොවීන් වෙනුවෙන් මෙම වැඩ පිළිවෙල නැවත ආරම්භ කරමුයි යන්නත්, රටේ පවතින මෙම ගැටළුව අපේ ගැටළුවක් කර ගෙන මේ සඳහා විසඳුම් සොයමුයි යන්න සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා</u> සියළු දෙනාට ලැබූ වා වූ නව වසර සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනය කරමින් දීර්ඝ වූ ධූරය කාලය හමුවේ අපට මහ ඇරුණු අතපසු වූ කාර්යයන් ඉටු කර ගැනීමට අවස්ථාව හිමි වූ සේම, ආපසු හැරී බලන කල අපගේ අරමුණු හා ඉලක්ක ලඟා කර ගත්තේ ද යන්න ගැටළුව පැන නගින බවත්, කොවිඩ් වසංගතය සම්බන්ධයෙන් දිගින් දිගටම කතා කලා සේම පසුගිය කාලය පුරාම රටක් හැටියට හා සභාවක් ලෙස එලෙස කොවිඩ් රෝගය වැළඳුනු පවුල් වල සාමාජිකයන් සඳහා හා පවුල් සඳහා අවශ්‍ය පහසුකම් සැපයුවත් අද වන විට එම තත්වය මහත් වෙනසකට ලක් වී ඇති බවත්, මහජන පරීක්ෂකවරු ඒ සම්බන්ධයෙන් කිසිදු දැනුවත් වීමක් නොමැති සේම එය විශාල ගැටළුවක් වී පවතින බවත්,

කෘෂිතර්මාන්තය ගත් විට ඒ හා බැඳුණු ව්‍යාපාර , ඇතැම් විට ලාභ ලැබූ බව සත්‍ය වුවත්, එසේ සිදු වූයේ කෙසේද යන්න සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත්, ඉදිරියේදී එළවළු වල මිල ගණන් අංක 04 කින් දැක්විය හැකි තත්වයක් උදා වන බවත්, ඇතැම් නිෂ්පාදන තිබුණත් සාමාන්‍ය ජනතාවට එය මිල දී ගැනීමට නොහැකි තත්වයකට පත් වන බවත්, මේ සඳහා සභාවක් ලෙස යම් මැදිහත් වීමක් සිදු කල හැකි ද යන්නත්, එසේ හැකියාවක් පවතින්නේ නම් වගා කරුවන් වෙනුවෙන් අවශ්‍ය බීජ හෝ ලබා දීමට කටයුතු කරන ලෙසත්, රටේ පවතින මෙම ගැටළුව සම්බන්ධයෙන් මහජන නියෝජිතයින් ලෙස අප වගකිව යුතු වන බවත්, ගරු සභිකවරුන්ගෙන් නව නිර්මාණකරුවන් බිහි විය යුතු බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්. එම්. අයි ජනක ශ්‍රීමාලි මැතිණිය</u> සියළු දෙනා වෙත සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනය කරමින් බල ප්‍රදේශයේ බලධාරියා ලෙස රත්මලේ යෝධ ඇල බන්ට් එකෙහි කසළ බහාළුම් ස්ථාන කිහිපයක ගොඩ ගසා ඇති බවත්, නෙළුබැව නගරයේ මුස්ලිම් ගම්මානය ඉදිරිපිටින් ගලා යන ඇල මාර්ගයේද කසල ගොඩ ගැසීමක් දක්නට ලැබෙන බවත්, 21 ඇල වෙල් යාය ආරම්භ කරන තැන කිසිදු විධිමත් භාවයකින් තොරව අසෝභන ලෙස කසල බැහැර කිරීමක් සිදු කර ඇති බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙසත්, 267 තුලානයේ හීන් ඇල සම්බන්ධ වන අතුරු මාර්ගයේ ශාන්තිවාදී මරණාධාර සමිති ගොඩනැගිල්ලේ සිට පවන මහතාගේ නිවස දක්වා ඇල මාර්ගයත් සමඟ දිවෙන අතුරු මාර්ගය දැඩි අබලන් තත්වයේ පවතින බැවින් ඒ සඳහා බොරළු ස්වල්පයක් දමා දෙන ලෙසත්, අක්කර 07 හි මහින්ද මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය ද අබලන්ව ඇති බැවින් එය ද පිළිසකර කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද තමන් ඉල්ලීම් කර ඇති වීථි පහන් සවි කර දෙන ලෙස ද ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා</u> බල ප්‍රදේශයේ මේ වන විට පිළිසකර කර අවසන් කර ඇති මාර්ග වල හෝ බර සඳහන් කරන ලද නාම පුවරු සවි කිරීම සඳහා කටයුතු කිරීමට මේ වන විට උපදෙස් ලබා දී ඇති අතර, ප්‍රාදේශීය සභාව සතුව පවතින ඉඩම් ප්‍රතිසංස්කරණය කර අදාල වැට ඉදි කිරීමට කටයුතු කරන බවත්, බල ප්‍රදේශයේම මෙතෙක් නම් නොකරන ලද මාර්ග ඇත්නම් ඒ සඳහා ගම් වාසීන් හෝ ස්වේච්ඡා සංවිධාන හා එක් ව නම් කරන ලෙසත්, ඒ සඳහා සභා යෝජනාවක් ගෙන ගැසට් කිරීම සඳහා කටයුතු කරමුයි යන්න සඳහන් කරන ලද අතර ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සඳහන් කල පරිදී මාර්ග වල බොරළු ප්‍රවාහණය කරනු ලබන පුද්ගලයින් වෙත බල ප්‍රදේශයේ මාර්ග වල ගමන් කිරීම වෙනුවෙන් සභාවට ගෙවිය යුත මුදල ගෙවන ලෙසට උපදෙස් ලබා දී ඇති බවත්, අතිගරු ජනාධිපතිතුමා සඳහන් කල හා ඉදිරිපත් කර ඇති හරිත රාජ්‍යයක් යන සංකල්පය සඳහා තමන් විරුද්ධ නොවූ නමුත් අදාල කාර්යය ඉටු කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළු විනා මෙය කිසිදු වැරදි ප්‍රතිපත්තියක් නොවන බවත් මෙය නිවැරදි කරන්න බැය යන තත්වය උද්ගත වීම සඳහා විවිධ කුමන්ත්‍රණ හා මාෆියාවන් බලපෑ බවට කිසිදු සැකයක් නොමැති බවත්, මේ සඳහා මාධ්‍යද ඍජුවම බලපෑ ඇති බවත්, රජය විසින් ගෙන යන විවිධ සංවර්ධන වැඩසටහන් කිහිපයක් නොව විශාල සංවර්ධන ක්‍රියාදාමයක් රට තුල ක්‍රියාත්මක වන බවත්, ඉදිරියේදී මෙම තත්වය නිවැරදි වේය යන්න විශ්වාසයක් පවතින බවත්, සඳහන් කරමින්, ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2022.01.18 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 11.35 ට අවසන් කරන ලද අතර එළඹෙන මහ සභාව 2022.02.17 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| .................................... | .......................................... |
| බී. එච් ප්‍රදීප් නිශාන්ත, | එස්. බී කුමාරදාස, |
| ලේකම්, | සභාපති , |
| නැ. නු. ප ප්‍රාදේශීය සභාව, | නැ. නු. ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |